# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 12 දරන මුද්දර ගාස්තු
## (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **8.25** යි.      තැපැල් ගාස්තුව : රු. **5.00** යි.

# 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 12/2006.

මුද්දර ගාස්තු නැවත පැනවීම සඳහා ද ; 2002 අංක 11 දරන මුදල් පනතේ (III) වන කොටස ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද ; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. (1) මේ පනත 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

(2) මේ පනතේ විධිවිධාන 2006 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතු ය.

2. කොමසාරිස් ජනරාල්වරයා මේ පනත යථාපරිදි ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය භාරව කටයුතු කරනු ලැබිය යුතු ය. මේ පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා භාරව කටයුතු කළ යුතු බව.

## I වන කොටස

## මුද්දර ගාස්තු පැනවීම සහ නිදහස් කිරීම් සහ අදාළ කරගත යුතු කාර්ය පටිපාටිය

3. (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හෝ ඉන් පසු, ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව (මෙහි මින් මතු "මුද්දර ගාස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) ගාස්තුවක් — සාධන පත්‍ර සහ ලියවිලි සම්බන්ධයෙන් මුද්දර ගාස්තු අයකිරීම.

(අ) ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන ලද, සකස් කරන ලද හෝ ඉදිරිපත් කරන ලද ; හෝ

(ආ) සාධන පත්‍රය ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දේපළක් සම්බන්ධයෙන් වූ සාධන පත්‍රයක් ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරන ලද,

සෑම "විශේෂිත සාධන පත්‍රයක්" මතම අයකරනු ලැබිය යුතු ය.

(2) විවිධ පන්තිවලට අයත් සාධන පත්‍ර ප්‍රභේද සම්බන්ධයෙන් විවිධ අනුප්‍රමාණ නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම එම නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් වෙනත් පසුව යෙදෙන දිනයකදී ක්‍රියාත්මක විය යුතු ය. එම සෑම නියෝගයක් ම සාදා මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එකී කාලය ඇතුළත කිසිම පාර්ලිමේන්තු සැසිවාරයක් පවත්වනු නොලැබුයේ නම් එකී නියමය ඉන් ඉක්බිතිව ම පවත්වනු ලබන පාර්ලිමේන්තු රැස්වීම්වාරය සඳහා අනුමතය ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද යම් නියෝගයක් එකී අනනුමතයේ දින සිට බලපැවැත්වෙන පරිදි පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ මගින් ඊට කලින් ඒ යටතේ කරන ලද කිසිවකට හානියක් නොවිය යුතු ය. එම නියමය පරිච්ඡින්න වූ බවට වූ දිනය සඳහන් නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

විශේෂිත සාධනපත්‍ර.

4. "3 වන වගන්තියේ කාර්ය සඳහා විශේෂිත" සාධන පත්‍ර යන්නෙන් —

(අ) දිවුරුම් පෙත්සමක් ;

(ආ) රක්ෂණ ඔප්පුවක් ;

(ඇ) ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස ක්‍රියාකිරීමේ අධිකාරි පත්‍රයක් ;

(ඈ) යම් ව්‍යාපාරයක්, වෙළෙඳාමක්, වෘත්තියක් හෝ රැකියාවක් පවත්වාගෙන යාම සඳහා එම වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රැකියාව දරන්නා වෙත බලය දෙනු ලබන බලපත්‍රයක් වන්නා වූ තත්කාලයේ බලපවත්නා ලිඛිත නීතිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් ;

(ඉ) ණය කාඩ්පතක් ප්‍රකාරව අයවිය යුතු යම්කිසි මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා ණය කාඩ්පත් දරන්නකු වෙත සේවා සපයන්නකු විසින් කරනු ලබන හිමිකම් පෑමක් ඉල්ලා සිටීමක් හෝ ඉල්ලීමක් ;

(ඊ) අලුත් හෝ අමතර නිකුත් කිරීමක් මත හෝ පැවරීමක් හෝ මාරු කිරීමක් මත වූ කොටස් සහතිකයක් ;

(උ) නිශ්චිත හෝ එක්තරා මුදල් ප්‍රමාණයකට සහ යම් දේපළකට බලපාන්නා වූ බැඳීමක් හෝ උකස් කිරීමක් ;

(ඌ) පොරොන්දු නෝට්ටුවක් ;

(එ) යම් දේපළක් බදු දීම හෝ කුලියට දීමක් ;

(ඒ) යම් මුදලකට හෝ වෙනත් දේපළක් සඳහා දෙන ලද ලදුපතක් හෝ නිදහස් කිරීමක් ;

(ඔ) ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ශ්‍රී ලංකා ආර්ථික වර්ධනයේ යහපතට හේතුවන බවට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් සාධන පත්‍රයක්,

අදහස් වේ.

5. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන්පසු, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මුද්දර ගාස්තු ගෙවීමෙන් බැහැර කළ යුතු සාධන පත්‍ර නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය. නිදහස් කිරීම.

6. පටහැනිව යම් ගිවිසුමක් ඇති අවස්ථාවල දී හැර— මුද්දර ගාස්තු ගෙවිය යුතු තැනැත්තන්.

(අ) රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන්, එම රක්ෂණ ඔප්පුව බලපාන්නා වූ තැනැත්තා විසින් ;

(ආ) යම් කොටසක් පැවරීමේ දී හෝ සතු කිරීමේ දී එකී කොටස් පැවරුම් ලාභියා හෝ සතු කරනු ලැබූ තැනැත්තා විසින් ;

(ඇ) බදු දීමක් සම්බන්ධයෙන් වන විට බදු ගැනුම්කරු විසින් ; සහ

(ඈ) සේවා සපයන්නකු විසින් ණය කාඩ්පත් දරන්නකුගෙන් හිමිකම් ඉල්ලීමක්, ඉල්ලීමක් හෝ ආයාචනයක් කරනු ලබන අවස්ථාවක, ණය කාඩ්පත දරන්නා විසින් ; සහ

(ඉ) වෙනත් සියළු අවස්ථාවල දී, එකී සාධන පත්‍රය සකස් කරන, සාදනු ලබන හෝ ලියා අත්සන් කරන තැනැත්තා විසින්,

මුද්දර ගාස්තු ගෙවනු ලැබිය යුතු ය.

මුද්දර ගාස්තු සමථයට පත් කිරීම.

7. (1) 6 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද—

(අ) රක්ෂණ ඔප්පු නිකුත් කරනු ලබන යම් තැනැත්තකු විසින් ;

(ආ) බලපත්‍ර නිකුත් කරන යම් අධිකාරියක් විසින් ;

(ඇ) ණය කාඩ්පතක් භාවිච්චි කිරීමේ දී යම් මුදල් ගෙවීමක් සඳහා හිමිකම් පාන, ඉල්ලා සිටින හෝ ඉල්ලුම් කරන ඉල්ලීමක් මත යම් සේවා සපයන්නකු විසින් ;

(ඈ) සේවකයන් සඳහා කරන ලද ගෙවීම් සඳහා ලදුපත් භාරගනු ලබන පුද්ගලයන් සියයකට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති සේවා යෝජකයකු විසින් ;

(ඉ) නියම කරන ඇති ආකාරයට හෝ අවස්ථාවට අනුව යම් ප්‍රභේදයක් සාධන පත්‍ර ලෙස මුද්දර යෙදීම ප්‍රායෝගික නොවන හෝ කාර්යයක් වීම නොවන ලෙස සැලකිල්ලට ගැනීමේ දී යම් වෙනත් ආකාරයේ සාධන පත්‍ර නිකුත් කරන වෙනත් තැනැත්තකු විසින්

පිළිවෙළින් එකී රක්ෂණ ඔප්පුව, බලපත්‍ර, හිමිකම් සාධන පත්‍රය, ලදුපත හෝ වෙනත් සාධන පත්‍රය ප්‍රකාර මුද්දර ගාස්තු වශයෙන් අය විය යුතු මුදල, කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ලබාගෙන ඇත්නම් සමථයකට පත්කළ යුතු අතර, වෙනත් ආකාරයකට නියෝගකර නොමැති නම්, එම ගාස්තු ප්‍රමාණය සෑම වසරකම මාර්තු 31 වන දින, ජුනි 30 වන දින, සැප්තැම්බර් 30 වන දින සහ දෙසැම්බර් 31 වන දින යන දිනවලින් අවසන් වන කාර්තු අවසන් වී දින පහළොවක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය :

එසේ වුව ද, මේ පනත ප්‍රකාරව මුද්දර ගාස්තු වශයෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය සමථයට පත්කරනු ලබන යම් තැනැත්තකු කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි වී, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයට වූ බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව සමථයට පත්කර ඇති යම් මුද්දර ගාස්තුවක් ගෙවා ඇති අවස්ථාවක දී, එම ගාස්තුව සමථයට පත් කිරීම සඳහා බලය දී ඇති ( (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් සේවා

නියුක්තයකු හැර) යම් තැනැත්තකු විසින් පහත දැක්වෙන ආකෘතියට සාරානුකූලවන්නා වූ සහතික පත්‍රයක් මුද්දර ගාස්තු ගෙවීමට යටත්ව තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය :—

"...............................(සාධන පත්‍රයේ ස්වභාවය සඳහන් කරන්න.)

සම්බන්ධයෙන් මුද්දර ගාස්තු වශයෙන් ගෙවිය යුතු රු............ ක මුදලක් 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තිය ප්‍රකාර ලබාගෙන ප්‍රේෂණය කළ බවට මෙයින් සහතික කරනු ලැබේ.

මුද්දර ගාස්තු ගෙවිය යුතු ආකාරය.

8. (1) 7 වන වගන්තිය ප්‍රකාර ආකාරයකට මුද්දර ගාස්තු සමථයකට පත්කර නොමැති අවස්ථාවක හැර, සාධන පත්‍රය ලියා අත්සන් කරන අවස්ථාවේ දී නියමිත වටිනාකමින් යුත් ඇලවෙන මුද්දර ගැසීම මගින් මුද්දර ගාස්තු ගෙවනු ලැබිය හැකි ය ; මුද්දර ගාස්තු ගෙවීමට යටත්වන තැනැත්තා විසින් එම මුද්දර නැවත පාවිච්චි කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන කොටස් පැවරීම සඳහා, එසේ ලියා අත්සන් කිරීමේ දින සිට එක් මාසයක් ඇතුළත ඒ සඳහා මුද්දර අලවනු ලැබිය යුතු ය.

(2) සාධන පත්‍රයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට ගෙවා නිමකර ඇති අවස්ථාවක, එම සාධන පත්‍රයට යථා පරිදි මුද්දර අලවා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

මුද්දර ගාස්තු ගෙවිය යුතු ස්ථානය.

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ සඳහන් ලේඛන සහ සාධන පත්‍ර සම්බන්ධයෙන් පළාත් සභාවකට ගෙවිය යුතු සියලු මුද්දර ගාස්තු, අවස්ථාවෝචිත පරිදි එකී සාධන පත්‍රය ලියා අත්සන් කරනු ලැබූ හෝ එම දේපළ පිහිටා ඇති පළාත් සභා සීමා තුළ ද ඇති පළාත් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛනයේ දක්වා ඇති යම් පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභා සීමාවක් ඇතුළත ලියා අත්සන් කරන ලද යම් ලේඛනයක් සම්බන්ධයෙන්, එහි දී අයකළ යුතු මුද්දර ගාස්තු, යම් පළාත් සභාවක් විසුරුවා ඇති අවස්ථාවක දී, එකී පළාත් සභාව පසුව පිහිටුවනු ලබන තෙක්, එකී පළාත් සභාව සම්බන්ධයෙන් තත්කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිර්දේශ කරනු ලැබිය හැකි බැංකුවක් වෙත ගෙවනු ලැබිය යුතු ය.

යම් ලේඛනයකට ප්‍රමාණවත් නොවන මුද්දර අලවා ඇති අවස්ථාවක කාර්ය පටිපාටිය.

10. මුද්දර ගාස්තු ගෙවීමට යටත්වන යම් සාධන පත්‍රයක් සඳහා නිසිපරිදි මුද්දර අලවා නොමැති බව තක්සේරු කරුවකුගේ මතය වන අවස්ථාවක, එම මුද්දර ගාස්තුව ගෙවීමට යටත් තැනැත්තා විසින් එම සාධන පත්‍රය සම්බන්ධයෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුවේ වටිනාකම තක්සේරුකරු විසින් තක්සේරු කළ යුතු අතර එම තැනැත්තා වෙත දැන්වීමක් යවමින් එම දැන්වීමේ සඳහන් කාලය ඇතුලත එහි සඳහන් මුදල ගෙවන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය.

දේශීය ආදායම් පනතේ විධිවිධාන අදාල විය යුතු බව.

11. තක්සේරු කිරීම, අභියාචන, අභියාචන පිළිබඳව තීරණය කිරීම සහ තක්සේරුවල අවසානාත්මක භාවය සහ ආදායම් බදු අයකර ගැනීම හෝ ආපසු ගෙවීමට අදාළව දේශීය ආදායම් පනතේ XVIII සිට XXIV පරිච්ඡේදවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ තක්සේරු කිරීම්, අභියාචන, අභියාචන පිළිබඳව තීරණය කිරීම සහ තක්සේරු කිරීම්වල අවසානාත්මක භාවයට සහ මුද්දර ගාස්තු අය කිරීම හෝ ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## II වන පරිච්ඡේදය

## සාමාන්‍ය විධිවිධාන

නියෝග.

12. (1) මේ පනත යටතේ නියම කරනු ලැබිය යුතු බවට නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ සෑදීම සඳහා නියම කර ඇති හෝ බලය දී ඇති නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එය ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලබන යම් පසුව එළඹෙන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

13. මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට සහ ඉන් පසු නිශ්චල දේපළ පැවරීමට, මෝටර් වාහන පැවරීමට හෝ අධිකරණයේ ගොනු කරන ලිපිලේඛනවලට අදාළ සාධන පත්‍ර හැර, මුද්දර ගාස්තු පැනවීම, නිදහස් කිරීම් සහ වෙනත් විධිවිධාන මේ පනතේ විධිවිධානවලට අනනුකූලවනතාක් දුරට මුද්දර ගාස්තු පැනවීම, නිදහස් කිරීම සහ වෙනත් යම් විධිවිධානවලට අදාළව 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොවිය යුතු අතර මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය. 1982 අංක 43 දරන පනත ක්‍රියාත්මක වීම.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ— අර්ථ නිරූපණය.

"තක්සේරුකරු" සහ "කොමසාරිස් ජනරාල්වරයා" යන්නට දේශීය ආදායම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"දේශීය ආදායම් පනත" යන්නෙන් 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදහස් වේ.

## III වන පරිච්ඡේදය

## 2002 අංක 11 දරන මුදල් පනතේ III වන කොටස ඉවත් කිරීම

15. 2002 මැයි 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත සිදුකරන ලද යම් දෙයකට හානියක් නොමැතිව 2002 අංක 11 දරන මුදල් පනතේ III වන කොටස 15 සිට 18 දක්වා වූ වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ. 2002 අංක 11 දරන පනතේ III වන කොටස ඉවත් කිරීම.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.